# වැඩ වර්ජනය හා අජීර්ණය

**ඒ නිසා ඉදිරියේදී වැඩ කරන ජනතාවට පඩි වැඩි කරගැනීමට අවශ්‍ය නම් කලයුතුව ඇත්තේ එන එන වර්ජන අසාර්ථක කිරීමය. ඒනිසා "අරගලයකින් තොරව ලබා ගත් දෙයක් නොමැත" යන ජනතාවාදී කියමන ඇත" යනුවෙන් වෙනස් කිරීමට මෙම වර්ජනය තුලින් ජේ වී පී යට සිදුවිය. එසේම විමල් පිල තමන්ගෙන් බිඳී වෙන්වී ගියත් තවමත් අපි ශක්තිමත් යන්න ජේ වී පී යට මෙම වර්ජනය තුලින් පෙන්වීමට අවශ්‍ය විය. එයද පුස්සක් බවට පත්විය. අන්තිමේදී ලාල් කාන්තට මෙම වර්ජනය අජීර්ණයක් විය. සෝමවංශ අමරසිංහ ද, ටිල්වින් සිල්වා ද මෙම වර්ජනය ගැන කට පරිස්සම් කර ගන්නට වග බලාගෙන ඇත.**



**අන්තිමේදී ලාල් කාන්ත සහෝදරයාට සිදුවූයේ සාලිය ජාතකයේ එන වෙදාට සිදුවූ දේය. නයි වෙනුවට සැලලිහිණි පැටව් පෙන්වා ලමුන් රවටා වාසියක් ගන්නට මාන බැලූ වෙදාගේ ඔලුව උඩට සර්පයා වැටිණි. සාලිය ජාතකයේ වෙදාගේ උපාය අසාර්ථක වුවාසේම ලාල් කාන්තද මෙදා අසාර්ථක විය.**

වැඩ වර්ජන යනු ශ්‍රී ලාංකිකයන්ට අළුත් අත්දැකීමක් නොවේ. ඉතිහාසයේ පටන්ම ශ්‍රී ලාංකිකයන්ට තර්ජන වර්ජන ගර්ජන හොඳහැටි පුරුදුය. මෙල්බර්න් නුවර "බඩගින" ගම්මානයද ආවේ ශ්‍රී ලාංකිකයන් පිරිසක් කෑම ඉල්ලා බඩගිනි කියා වර්ජනයක් ආර්ම්භ කළ කියාය. කම්කරුවන් හා පාලකයන් අතර ගැටුම් ආර්ම්භ වන්නේ වර්ජන තුළින්ය. "මට නම් ඔය වචනෙ අරහං" එක්තරා පාලකයෙක් වැඩ වර්ජන ගැන දෙසා බෑවේ එසේය. ඔවුන්ට මෙම වචනය එතරම් තිත්තය. නමුත් විපක්ෂයේ සිට පාලන බලය ලබා ගැන්මට දඟලන කාලයේ ඔවුන්ට මෙම වචනය "සම්මා සම්බුද්ධ" මෙන් පැණි රසය. ඒ කාගේ මළමිනියක් උඩින් හෝ බලය ලබා ගැනීමට "වර්ජන" උදව් කරන නිසාය. වරක් ඇතුලත්මුදලි ඇමතිවරයා ජූලි වර්ජනයන් හැඳින්වූයේ "නරි" ලෙසය.

ශ්‍රී ලාංකාවේ මුල්ම වැඩ වර්ජනයක් දියත් කලේ මුද්‍රණ සේවකයන්ය. ඒ කාලයේ අද මෙන් මද්‍රණයට තාක්ෂණික මෙවලම් නොවීය. අතින් අකුරු අමුණන, ඊයම්වලින් "බ්ලොක්" හදන "ලෙටර් පූස්" ක්‍රමයට මුද්‍රණය කර්මාන්තයක් ලෙස තිබූ ඒ වකවානුවේ එම මුද්‍රණ සේවකයන් වැඩි පඩි ඉල්ලා වර්ජනයක් දියත් කර තිබූ බව ඉතිහාසයේ සඳහන් වේ.

ඊට පසු ශ්‍රී ලාංකාවේ වැඩිම වර්ජන ප්‍රමාණයක් දියත් කර ඇති සේවකයන් වන්නේ වරායේ කම්කරුවන්ය. ඒ කාලයේ ඔවුන්ට නොමිලේ ලබාදෙන බත් පැකට් එකේ වැලි කැටයක් තිබුණත් වැඩ වර්ජන ආරම්භ කරන කාලයක් වරායේ තිබිණි. නමුත් මෑත කාලයේ වැඩිම වර්ජන රැල්ලක් දියත් කළ සේවකයන් වන්නේ වතු කම්කරුවන් හා සෞඛ්‍ය සේවකයන් මෙන්ම දොස්තරවරුන්ය. මෑතකාලයේ හෙදියන් හා දොස්තරවරුන් රෝහලක කාමර පොරයක් නිසා ද වැඩ වර්ජනයක් ආර්ම්භ කරමින් රෝගීන් දෙතුන් දෙනෙක් ද මිය පරලොව යැවීය.

නමුත් මේ බොහෝ වැඩ වර්ජන වලින් ලැබූ දේට වඩා නොලැබූ දේවල් බොහෝය. ඩඩ්ලි සේනානායක රජය කාලයේ වර්ජන රැල්ල තුලින් ඇතිවූ පොලිස් වෙඩිතැබීමක් නිසා ඩඩ්ලිට සැඟවී සිටීමට සිදුවූයේද ආණ්ඩු වෙනස්කම් සිදුවූයේද මේ වර්ජන නිසාය. නමුත් ඊට පසු ඇතිවූ ආණ්ඩුවලට වර්ජන තුලින් ප්‍රබල වෙනස්කම් කරන්නට වර්ජකයන්ට නොහැකිවිය.

77 ජේ ආර් ජයවර්ධන රජය බලයට පත්වී ඇතිවූ විශාල වැඩ වර්ජනය තුලින් ජේ ආර් සැලුනේ නැත. ඔහුවර්ජනය කළ සියලු සේවකයන් රැකියාවෙන් දොට්ට දමා සේවයට වාර්තා කරන ලෙස දින කිහිපයක් දී සේවයට වාර්තා නොකල සේවකයන් ගෙදර යැවීය. ඒ ඇති වූ පුරප්පාඩුවලට තම පාක්ෂිකයන් රිංගවීය. පලපුරුද්දක් නැති මිනිස් ශ්‍රමය තුලින් රාජ්‍ය සේවයේ අකාර්‍යක්‍ෂමතාවය ඇරඹුමත් ඒ අවදියේය. ඊට පසු එදා ජූලි වර්ජකයන්ට නැවත රැකියාව ලබා දෙන බවට, මතිවරණ වේදිකාවල විපක්ෂය හඬ නැගුවේ වර්ජකයන් ප්‍රධාන සටන් පාඨයක් බවට පත් කරවමිනි. නමුත් වසර 16කට පසු බලයට පත් වූ විපක්ෂයට (පොදු පෙරමුණ ආණ්ඩුවට) රැකියා දෙන්නට තරම් වර්ජකයන් ප්‍රමාණයක් ඉතිරිව සිටියේ නැත. එසේ වන විට සමහර වර්ජකයන් සිටියේ හැරමිටියෙන් ගමන් කරමිනි. සමහරුන් පොළවට පස් වීය. අන්තිමේදී ඒ වර්ජකයන් ජයග්‍රහණය කලේ විපක්ෂය පමණි.

අද අපේ රටේ බොහෝ වෘත්තීය සංගම් නායකත්වය හිමිකරගෙන ඇත්තේ ජේවීපී යයි. ප්‍රධාන විපක්ෂයේ සිටින යූ ඇන් පී සිරිනාල් ද මෙල්ට වඩා ලාල් කාන්ත ප්‍රබල චරිතයක් වන්නේ ඒ නිසාය. බලය තිබූ කාලයේ ජාතික සේවක සංගමය කල් වර්ජකයන්ගේ ඔලු පැලීමය. නැත්නම් බයිසිකල් චේන් පැද්දීමය. එසේත් නැත්නම් පුස්තකාලවලට ගිනි තැබීමය. නමුත් අද දිනේ ජාතික සේවක සංගමයට එසේ සෙල්ලම් කිරීමට හැකියාවක් නැත. ඔවුන් නායකත්වය සේම "පුස්සක්" බවට පත්ව ඇත.

රු.5000කින් වැඩි පඩි ඉල්ලා වර්ජනය ආරම්භ කළ ලාල්කාන්ත සහෝදරයා වර්ජනය නතර කරන බව පැවසුවේ අඩුතරමින් රු.3000ක් වත් ඉල්ලා නොවේ. මැතිවරණ අවලංගු කරන ලෙස ඉල්ලාය. මේ පීඩිත පන්ති නායකයා වැඩ කරන ජනතාවට කෙතරම් ආදරේද කියා තේරුම් ගන්නට මෙය ප්‍රමාණවත්ය. එසේම යුද්දෙට ආ වැඩූ ජනතා විමුක්ති පෙරමුණට මෙම වැඩවර්ජනය භූමරංගයක් විය. පාලක පක්ෂයට මුලින් තුරුම්පු සැපයූ ජේ වී පී ය එම තුරුම්පුවලින් කපා දැමීමට රජය සමත් වූයේ ජනතාවගේ විශ්වාසය තමන් වෙත නම්මවාග නිමිනි. මහින්ද රාජපක්ෂ රජය කෙරෙහි ජනතාව තවමත් දැඩි විශ්වාසයෙන් පසුවෙයි.

එම විශ්වාසය ඇති කිරීමට ජේ වී පී යද මුලින් සම්මාදන් විය. එසේම මුලින් සහයෝගය දෙනවා යැයි කියූ රනිල්ගෙන්ද, ලාල් කාන්තට වර්ජනය ආරම්භ කරන විය සහයෝගය නොලැබෙන තැනට පත්වුයේ ඇයි ද යන්න ජේ වී පී ය දෙවරක් සිතා බැලිය යුතුය. වර්ජනය සාර්ථක කර එම ලකුණ ජේ වී පී යට දෙන්නට රනිල් කිසි දිනක ඉඩ දෙන්නේ නැත. බලය ලබා ගැනීමට මාන බලන රනිල් අන්තිම වන තුරු තම සරම කැස කැවූයේ වර්ජන රැල්ල තමන් වෙත නම්මවා ගැනීමටය. එනිසා එකිනෙකට අවිශ්වාස වෘත්තීය සමිතිවලින් හෙබි නායකත්වයක් ආරම්භ කරන වර්ජනයක් සාර්ථක වන්නේ කෙසේද? අන්තිමේදී විශාල ලෙස පුම්බා ආර්ම්භ කළ බැලුම් බෝල වර්ජනය දඩස් ගා බිඳී ගියේ එම වර්ජනයේ වාසිය රජය වෙත හරවමිනි. වර්ජනය නොකර රජයට සහය දැක්වීම වෙනුවෙන් අඩු තරමින් රු.2000කින්වත් පඩි වැඩි කිරීමට ලිපි ලේඛන සකස් කරන බව රජය දැන් පොරොන්දු වෙයි. ඒ නිසා ඉදිරියේදී වැඩ කරන ජනතාවට පඩි වැඩි කරගැනීමට අවශ්‍ය නම් කලයුතුව ඇත්තේ එන එන වර්ජන අසාර්ථක කිරීමය. ඒනිසා "අරගලයකින් තොරව ලබා ගත් දෙයක් නොමැත" යන ජනතාවාදී කියමන ඇත" යනුවෙන් වෙනස් කිරීමට මෙම වර්ජනය තුලින් ජේ වී පී යට සිදුවිය. එසේම විමල් පිල තමන්ගෙන් බිඳී වෙන්වී ගියත් තවමත් අපි ශක්තිමත් යන්න ජේ වී පී යට මෙම වර්ජනය තුලින් පෙන්වීමට අවශ්‍ය විය. එයද පුස්සක් බවට පත්විය. අන්තිමේදී ලාල් කාන්තට මෙම වර්ජනය අජීර්ණයක් විය. සෝමවංශ අමරසිංහ ද, ටිල්වින් සිල්වා ද මෙම වර්ජනය ගැන කට පරිස්සම් කර ගන්නට වග බලාගෙන ඇත. ඔවුන්ගේ ප්‍රකාශන නිකුත් නිරීම බොහෝ ප්‍රවේශමෙන් නිකුත් කිරීමට ඔවුන් වගබලාගෙන ඇත.

අන්තිමේදී ලාල් කාන්ත සහෝදරයාට සිදුවූයේ සාලිය ජාතකයේ එන වෙදාට සිදුවූ දේය. නයි වෙනුවට සැලලිහිණි පැටව් පෙන්වා ලමුන් රවටා වාසියක් ගන්නට මාන බැලූ වෙදාගේ ඔලුව උඩට සර්පයා වැටිණි. සාලිය ජාතකයේ වෙදාගේ උපාය අසාර්ථක වුවාසේම ලාල් කාන්තද මෙදා අසාර්ථක විය.

ඒ නිසා මෙම වර්ජනය තුලින් වෘත්තීය සමිති නායකයින්ට වැදගත් පණිවිඩයක් ලබාදෙයි. ඒ කිසිවෙකු දූවිලි මිටක් ගෙන උඩු සුළඟට විසි කළ විට එය නැවත ගසාගෙන විත් ඔහුගේම ඇඟට වදින්නා සේ අනුන්ගේ පිහිටෙන් වෙනත් පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීමට මාන බලන්නා එම උපායවලටම අසුවී විනාශ වෙන බවයි.

ලක්ෂමන් කොඩිතුවක්කු








